# ඩී.එස්. සේනානායක විදුහල, කොළඹ 07.

## දෙවන වාර පරීක්ෂණය - 2016

## 12 ශ්‍රේණිය

**කාලය පැය 03 යි.**

නම: ........................................................................ අංකය:- ........................................

**මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 02න් සමන්විතය.**

I **කොටස** ( 1 × 40 = 40 )
**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

II **කොටස** ( 20 × 3 = 60 )
**අනු කොටස් 02න් සමන්විතය.**
**එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

---

## I කොටස

- **අංක 01 සිට 05 දක්වා ඇති ප්‍රශ්නවලට වඩා සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ස්ත්‍රී රුවක කැටයමක් සහිත ඉතා දුර්ලබ ගනයේ කොරවක් ගලක් හමුවන්නේ

i. අනුරාධපුරයේ රත්න ප්‍රාසාදයෙනි.
ii. මිහින්තලයේ කණ්ඨක චෛත්‍යයෙනි.
iii. පොළොන්නරුවේ ලංකාතිලක විහාරයෙනි.
iv. අනුරාධපුරයේ රුවන්වැලිසෑයෙනි.
v. අනුරාධපුරයේ බිසෝ මාළිගයෙනි.

02. මෑත යුගයේ ශ්‍රී ලාංකික මූර්ති ශිල්පියෙකු අතින් බිහි වූ "දුෂ්කර ක්‍රියා කරන බුදුන් වහන්සේ " නමැති ලෝකඩ මූර්තිය මැග්සයිසේ සම්මානයට පාත්‍ර විය. එම මූර්තිය නිර්මාණය කරන ලද්දේ

i. තිස්ස රණසිංහ මහතා විසින් ය.
ii. සුමන දිසානායක මහතා විසින් ය .
iii. එල්. ටී. පී. මංජු ශ්‍රී මහතා විසින් ය.
iv. රිචඩ් ගේබ්‍රියල් මහතා විසින් ය.
v. ජේ. ඩී. ඒ. පෙරේරා මහතා විසින් ය.

03. ලෞරියා නන්දගර් අශෝක ස්ථම්භය මුදුනේ

i. සිංහ රුවක් නංවා ඇත.
ii. ගව රුවක් නංවා ඇත.
iii. ඇත් රුවක් නංවා ඇත.
iv. අශ්ව රුවක් නංවා ඇත.
v. බහිරව රුවක් නංවා ඇත.

04. "නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩන" නම් වූ සිතුවම් නිර්මාණය කළ පශ්චාත් උපස්ථිති වාදී ශිල්පියා

i. පැබ්ලෝ පිකාසෝ ය.
ii. වින්සන්ට් වැන්ගෝ ය.
iii. පෝල් සෙසාන් ය.
iv. පෝල් ගොගෑන් ය.
v. එඩ්ගා ඩෙගා ය.

05. ග්‍රීසියෙන් හමු වූ '' වීනස් දි මේලෝ'' මූර්තිය නිර්මාණය කළ ශිල්පියා වන්නේ

i. ෆීඩියාස් ය..
ii. ඇන්ටිසෝව් ය.
iii. මයිරන් ය..
iv. ප්‍රැක්සිටෙලස් ය.
v. ලිසිපස් ය.


- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට පහත රූප සටහන් ඇසුරින් වඩා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.




A



B



C



D



E

06. A අක්ෂරයේ රූප සටහනෙන් දැක්වෙන බිතුසිතුවම

i. රිදී විහාරයේ සිතුවම් කර ඇති තේමිය ජාතකයයි.
ii. දඹුලු විහාරයේ ජාතක කතා සිතුවමක කොටසකි.
iii. මැදවල විහාරයේ සිතුවම් කර ඇති සුතසෝම ජාතකයයි.
iv. රිදී විහාරයේ සිතුවම් කර ඇති තේලපත්ත ජාතකයයි
v. පොළොන්නරු යුගයට අයත් තිවංක පිළිමගෙයි ඇති තේමිය ජාතකය චිත්‍ර පෙළයි.

07. B අක්ෂරයේ රූප සටහනෙන් දැක්වෙන බිතුසිතුවම්

i. සීගිරි සිතුවම් අතර දක්නට ඇති දුර්ලභ ගණයේ සිතුවම් කොටසකි.
ii. තිවංක පිළිමගෙයි දේවාරාධනය නම් සිතුවමයි.
iii. මහනුවර හිඳගල විහාරයේ පර්වතයේ ඉහළ කොටසේ ඇති සිතුවමකි
iv. දිඹුලාගල මාරාවීදියේ ලෙන් සිතුවමකි.
v. පුල්ලිගොඩ ලෙනෙහි ඇති සිතුවම්ය.

08. C අක්ෂරයේ රූප සටහනෙන් දැක්වෙන බිතුසිතුවම

i. පටු තීරය තුළ අඛණ්ඩ කථන ක්‍රමයෙන් ඇඳ ඇති පහතරට සම්ප්‍රදායික සිතුවමකි.
ii. මෙම සිතුවම්වලට දේශීය ආභාශයෙන් යුත් උඩරට සම්ප්‍රදායික සිතුවමකි.
iii. රතු පසුබිමහි හිස් අවකාශය වැඩි වශයෙන් දක්නට ලැබීම පහතරට සම්ප්‍රදායේ සිතුවම්වල ඇති විශේෂ ලක්ෂණයකි.
iv. පුලුල් තීරයක් තුළ තුළ අඛණ්ඩ කථන ක්‍රමයෙන් විදේශීය ආභාශය සහිතව සිතුවම් ඇඳීම පහතරට සිතුවම්වල විශේෂ ලක්ෂණයකි.
v. මෙහි සියලුම මානව රූප පාර්ශව දර්ශීව නිර්මාණය කර ඇත.

09. D අක්ෂරයේ රූප සටහනෙන් දැක්වෙන බිතුසිතුවම

i. දෙගල්දොරුව විහාරයේ දළදා පෙරහැර සිතුවමයි.
ii. උඩරට සම්ප්‍රදායට අයත් ගංගාරාමය විහාරයේ වෙස්සනතර ජාතකය සිතුවමයි.
iii. දෙගල්දොරුව විහාරයේ සුතසොම ජාතකයයි.
iv. ගංගාරාමය විහාරයේ දළදා පෙරහැර සිතුවමයි.
v. දෙගල්දොරුව විහාරයේ වෙස්සනතර ජාතකයේ ඇලි ඇතුන් දන්දීමේ සිතුවමයි.

10. E අක්ෂරයේ රූප සටහනෙන් දැක්වෙන බිතුසිතුවම

i. සීගිරි අප්සරාවන්ගේ සිතුවමකි.
ii. අජන්තා ලෙන් විහාරයේ පද්මපාණී බෝධිසත්ව රූපයයි.
iii. තිවංක පිළිමගෙයි දක්නට ඇති පද්මපාණී බෝධිසත්ව රූපයයි.
iv. පුල්ලිගොඩ ලෙනෙහි දේවතා රුවකි.
v. අජන්තා ලෙන් විහාරයේ අප්සරා සිතුවම්ය.

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. ඡායාරූප ශිල්පියෙකු වූ ලයනල් වෙන්ඩ් මහතාගේ මූලිකත්වයෙන් 1943 දී ආරම්භ කරන ලද "43 කණ්ඩායම" ට අයත් ශිල්පීන් වන්නේ

i. රිචඩ් ගේබ්‍රියල්, ජෝජ් කීට්, අයිවන් පීරිස්, ඩේවිඩ් පේන්ටර් යන ශිල්පීන්ය.
ii. ඩේවිඩ් පේන්ටර්, මංජු ශ්‍රී, ජෝජ් කීට්, අයිවන් පීරිස් යන ශිල්පීන්ය.
iii. ජෝජ් කීට්, අයිවන් පීරිස්, රිචඩ් ගේබ්‍රියල්, හැරී පීරිස් යන ශිල්පීන්ය.
iv. ඩේවිඩ් පේන්ටර්, ජෝජ් කීට්, අයිවන් පීරිස්, මංජු ශ්‍රී යන ශිල්පීන්ය.
v. මංජු ශ්‍රී, ජස්ටින් දැරණියගල, ඔබ්රි කොලට්, ඩේවිඩ් පේන්ටර් යන ශිල්පීන්ය.

12. එම්. සාර්ලිස් ශිල්පියාගේ විහාර සිතුවම් කලාව සම්බන්ධයෙන් වඩාත්ම උචිත ප්‍රකාශය වන්නේ

i. රේඛාව හා වර්ණය සම සමව භාවිතා කර ඇත.
ii. වර්ණයට වැඩි තැනක් දී ඇති අතර රේඛාව නොසලකා හැර ඇත.
iii. දෘෂ්ටිගත පර්යාවලෝකය මත පිහිටා හැඩතල රචනය කරමින් ත්‍රිමාණ බව දැක්වෙන අයුරින් වර්ණ භාවිත කොට ඇත.
iv. තාත්විකත්වය රැකෙන අයුරින් වර්ණ හසුරවා ඇත.
v. අඛණ්ඩකථන ක්‍රමයෙන් සිතුවම් නිර්මාණය කර ඇත.

13. දේශීය සිතුවම් කලාවේ උතුම් වූ ගුණාංග හා ආසියාතික සිතුවම් සම්ප්‍රදායන් ගුරු කොට ගෙන රේඛාවට මුල්තැන දෙමින් මෙතෙක් පැවති විහාර බිතුසිතුවම් කලාව නවතම ශෛලියකින් ගොඩනගාගත් ශ්‍රී ලාංකීය චිත්‍ර ශිල්පියා

i. එම්. සාර්ලිස්
ii. ජෝජ් කීට්.
iii. සෝලියස් මෙන්දිස්.
iv. ඩේවිඩ් පේන්ටර්.
v. සෝමබන්ධු විද්‍යාපති.

14. බතික් නිර්මාණ කලාව ලාංකිකයින්ට හඳුන්වා දෙනු ලැබූ සිතුවම් ශිල්පියා

i. සුමන දිසානායක.
ii. ස්ටැන්ලි අබේසිංහ.
iii. ඩබ්. ජේ. ජී බීලිං
iv. ඔබ්රි කොලට්
v. රිචඩ් ගේබ්‍රියල්


15. ශාස්ත්‍රාලීය සිතුවම් කලාව අගයන ආලේඛ්‍ය සිතුවම් විශාල ප්‍රමාණයක් ඇඳි ලංකා කලා සංගමයේ ප්‍රබල සාමාජිකයෙකු ලෙස හැඳින්විය හැකි ශිල්පියෙකි

i. එම්. සාර්ලිස්
ii. ඩේවිඩ් පේන්ටර්.
iii. සෝමබන්ධු විද්‍යාපති. .
iv. ඒ. සී. ජී. එස්. අමරසේකර
v. අයිවන් පීරිස්


- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පහත රූප සටහන් ඇසුරින් වඩා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.



F




G



H



I



J

16. F අක්ෂරයෙන් දැක්වෙන්නේ ලංකාවේ පැරණි සෙල් බුද්ධ ප්‍රතිමාවකි එය

 i. අනුරාධපුර මහමෙවුනාවේ සමාධි බුද්ධ ප්‍රතිමාවයි.
 ii. අනුරාධපුරයේ තොලුවිළ ග්‍රාමයෙන් හමු වූ සමාධි බුද්ධ ප්‍රතිමාවයි.
 iii. පොළොන්නරුවේ වටදාගෙයි බුද්ධ ප්‍රතිමාවයි .
 iv. අනුරාධපුරයේ පන්කුළිය බුද්ධ ප්‍රතිමාවයි.
 v. පොළොන්නරුවේ මැදිරිගිරි වටදාගේ බුද්ධ ප්‍රතිමාවයි.

17. G අක්ෂරයෙන් දැක්වෙන්නේ ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයෙන් හමු වූ පූජක රුවයි. මෙය සොයාගෙන ඇත්තේ

 i. හරප්පාවේ ස්නානාගාරයක් තුළදීය.
 ii. ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයේ ප්‍රධාන නගරයක් වන ලෝතාල් වලින්ය.
 iii. මොහෙන්ජොදාරොවේ ප්‍රධාන වේදිකාවට ඊසාන දෙසින් විශාල ගොඩනැගිල්ලක තිබීය.
 iv. මොහෙන්ජොදාරොවේ ස්නානාගාරයක් තුළදීය.
 v. හරප්පාවේ ප්‍රධාන වීදියක දීය.

18. H අක්ෂරයෙන් දැක්වෙන්නේ පොළොන්නරු යුගයේ හින්දු ප්‍රතිමාවකි එය

 i. තාරා දේවියගේ ප්‍රතිමාවයි. ii. පාර්වතී ප්‍රතිමාවයි.
 iii. කාරයක්කල් අම්මයියාර් ප්‍රතිමාවයි iv. සෝමකන්ද ප්‍රතිමාවයි. v. ශිව දෙවියන්ගේ භාර්යාවයි.

19. I අක්ෂරයෙන් දැක්වෙන්නේ මිසරයේ නිර්මාණ ශිල්පියෙකු අතින් නිමවූ මූර්තියකි එය

i. අක්නේටන් රජුගේ බිරිඳ නෙෆර්ටිටිය　　ii. රම්සෙස් රජුගේ බිරිඳයි
iii. රහොටෙප්ගේ බිරිඳ නොප්‍රෙට්ය.　　iv. ක්ලියෝපැට්රාය.
v. නිශ්චිතවම කවුද යන්න සොයාගෙන නොමැති මූර්ති දෙකකි.

20. J අක්ෂරයෙන් දැක්වෙන්නේ හර්මිස් සහ ඩයෝනිස් මූර්තියයි. මෙය කරන ලද ශිල්පියා වන්නේ

i. මයිරන් ය.　　ii. ප්‍රැක්සිටැලස් ය.　　iii. පීඩියාස් ය.　　iv. ලිසිපස් ය.
v. හැගසැන්ඩ්‍රෝස්, පොලිඩොරස් සහ ඇතිනොඩොරස් යන තිදෙනාය.

- **ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා ප්‍රශ්නවල හිස්තැනට වඩා සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

21. "වැතිර ගත් කාන්තාව" නමැති මූර්තිය නිර්මාණය කළ ශිල්පියා වන්නේ ---------------------- ය.

i. තිස්ස රණසිංහ　　ii. හෙන්රි මුවර්
iii. පැබ්ලෝ පිකාසෝ　　iv. පෝල් සෙසාන්　　v. එඩ්ගා ඩෙගා

22. වර්තමානයෙහි ද නිරුපද්‍රිතව පවතින "මාකස් ඕරුලියස් විජයග්‍රහණ ස්ථම්භය" ------------------------ හි දක්නට ලැබෙයි

i. ග්‍රීසියේ ඇතන්ස්　　ii. ප්‍රංශයෙහි　　iii. රෝමයෙහි　　iv. ඉතාලියේහි　　v. ස්පාඤ්ඤයෙහි

23. "ගෝලය මත සමබරව සිටින දැරිය" නමැති සිතුවම ---------------------- ශිල්පියාගේ සිතුවමකි.

i. ජෝජස් බ්‍රාක්　　ii. පැබ්ලෝ පිකාසෝ　　iii. පෝල් සෙසාන්
iv. වින්සන් වැන්ගෝ　　v. පොල් ගොගෑන්

24. අශෝක ස්ථම්භයන් හි ගවරුවක් සහිත ස්ථම්භ ශීර්ෂයේ දක්නට ඇති ස්ථම්භය ...................................................... නමින් හඳුන්වයි.


i. බබීරා ස්ථම්භය　　ii. රුම්න්දෙයි ස්ථම්භය　　iii. ලෞරියා නන්දගර් ස්ථම්භය
iv. සාරානාත් ස්ථම්භය　　v. රාම්පූර්වා ස්ථම්භය


25. ශාන්ත පීතර දේවස්ථානයේ අමුත්තන්ගේ ශාලාවේ බිත්තියක ඇඳ ඇති "පර්නාසිස් " සිතුවම ---------------- ශිල්පියාගේ නිර්මාණයකි.

i. ලියනාඩෝ ඩාවින්චි　　ii. මයිකල් ආන්ජෙලෝ　　iii. රෆායල් සැන්ටි
iv. එඩ්වාඩ් මනේ　　v. එඩ්ගාඩෙගා

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට පහත රූප සටහන් ඇසුරින් නිවැරදි පිළිතුර සපයන්න.**



K


L


M



N



O

26. K අක්ෂරයෙන් දැක්වෙන්නේ ලියනාඩෝ ඩාවින්චි ශිල්පියාගේ සුවිශේෂී සිතුවමකි. එය .................................. නමින් හඳුන්වයි.

27. L අක්ෂරයෙන් දැක්වෙන ප්‍රතිමාව "මෝසස් " නමින් හඳුන්වයි මෙය නිර්මාණය කරන ලද්දේ ............................ නම් විශිෂ්ට නිර්මාණ කරුවාගේ ප්‍රතිභාපූර්ණ නිර්මාණයකි.

28. M අක්ෂරයෙන් දැක්වෙන සිතුවම .................................. නම් ශිල්පියාගේ ''පර්වතමස්තකයේ දේව මෑණියෝ ජේසු බිළිඳා සහ ශාන්තජෝන් '' ය.

29. N අක්ෂරයෙන් දැක්වෙන්නේ ප්‍රතිභා පූර්ණ මූර්තියක්වන ''ලැවකූන්ය' . මෙය ................................ යුගයට අයත්වෙයි.

30. O අක්ෂරයෙන් දැක්වෙන්නේ පුනරුද යුගයේ විසූ ශ්‍රේෂ්ඨ ශිල්පියෙකු වූ රෆායල් විසින් නිර්මාණය කරන ලද ඇතන්ස්හි ගුරුකුලය නම් සිතුවමයි. මෙය දක්නට ඇත්තේ ........................................................... නැමති ගොඩනැගිල්ලේ ය.

**අංක 31 සිට 35 දක්වා ප්‍රශ්න යටතේ දී ඇති ප්‍රකාශවල හිස් තැන් නිවැරදි පිළිතුරු යොදා සම්පූර්ණ කරන්න**

31. ශ්‍රී ලංකාවේ ඇත් දත් කැටයම් අතර අග්‍රගන්‍ය නිර්මාණයක් වූ පංචනාරී ඝටය දැක්වෙන කැටයමක් .................................... හි දක්නට ලැබේ


32. නර්තනයෙහි හා වාදනයෙහි යෙදෙන පුද්ගලයින් රැසක් සහිත වාදක පෙරහැරක් දැක්වෙන 13 වන සියවසට අයත් අල්ප උන්නත කැටයමක් ශ්‍රී ලංකාවේ ........................................................දක්නට ලැබේ.

33. පැරණි සිංහල සැරසිලි මෝස්තර වල එන සූර්ය චන්ද්‍ර සටහන් ................................ වර්ගය අයත් වෙයි.

34. ලාක්ෂා කර්මාන්තයේ නියපොතු වැඩ සඳහා ..........................................ප්‍රදේශය ප්‍රසිද්ධියක් උසුලයි.

35. අත් දහයක් මුහුණු පහකින් සමන්විත වූ හින්දු සාහිත්‍යයේ දැක්වෙන ............................. කලාවට සම්බන්ධ දෙවියාය.

- ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා ප්‍රශ්නවලට පහත රූපය ඇසුරින් වඩා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.



මෙම සිතුවමෙන් දැක්වෙන්නේ (36) ...................................... යුගයට අයත් ය. කටාරම් කොටා සකසන ලද ලෙන් විහාරයක් වන (37) ........................................... හි මෙය සිතුවම් කර ඇත.. මෙම සිතුවම් විශාල වශයෙන් විනාශ වී ඇති අතර ඉතිරිව ඇති කොටසේ වස්තු විෂයන් දෙකක් ඇත.

ඒ (38) ........................................................................ සහ

(39)................................................................... යි. මෙම සිතුවම් (39) .....................................ශිල්ප ක්‍රමය යටතේ සිතුවම් කර ඇත.

# II කොටස

- මෙහි අනු කොටස් දෙකකින් සමන්විතය.
- එක් කොටසකින් එක බැගින් තෝරාගෙන ප්‍රශ්න 03ට පිළිතුරු සපයන්න.

---

## "අ" කොටස
## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

01) කාශ්‍යප රජු සීගිරිය ආලකමන්දාවක් කරගෙන එහි කුවේරයා සේ විසූ බව වංශ කතාවල මෙන්ම සෙල් ලිපිවලද සඳහන් ය.

i. සීගිරිය ආලකමන්දාවක්සේ ගොඩ නැගීමට කාශ්‍යප රජු ගත් උත්සහය ගැන කෙටි විස්තරයක් ලියන්න?

(ලකුණු 05)

ii. සීගිරි සිතුවම්වල වස්තුවිෂය, ශෛලිය සහ ශිල්ප ක්‍රම පිළිබඳ හැඳින්වීමක් කරන්න

(ලකුණු 07)

iii. **හිඳගලින්** හමුවී ඇති ක්‍රි. ව. 7වන සියවසට පමණ අයත් යැයි සැලකෙන සිතුවම් **සීගිරි** සිතුවම් තරමටම විද්වත් බවක් දක්වයි. එම සිතුවම්වල වස්තු විෂය හා කලා ලක්ෂණ පිළිබඳ විමසීමක් කරන්න.

(ලකුණු 07)

The National e-learning Portal for The General Education

02) ශ්‍රී ලංකාවේ අනුරාධපුර යුගයේ බිහි වූ බුදු පිළිම ලොව උසස්ම භාව පූර්ණ බුදු පිළිමසේ පිළිගනී.

i. අනුරාධපුර යුගයට අයත් බුද්ධ ප්‍රතිමා 04ක් නම් කරන්න.

(ලකුණු 04)

ii. අනුරාධපුර යුගයේ හමුවන ප්‍රධානම ආබද්ධ පිළිමයක් නම් කොට එලෙස ආබද්ධව නෙළීමේ වැදගත්කම පහදන්න.

(ලකුණු 06)

iii. අනුරාධපුර යුගයේ මූර්ති ශිල්පියා ගුණාත්මක අගයෙන් යුතු භාව පූර්ණ පිළිම නිර්මාණය සඳහා ඉන්දීය කලා සම්ප්‍රදායන්ගේ ආභාසය ලබා ඇත උදාහරණ සහිතව විමසීමක් කරන්න.

(ලකුණු 10)

03) අනුරපුර යුගයේ නිර්මාණය වී ඇති ගල් පුවරු කැටයම් ඉන පසුව එළඹි යුගවලට වඩා කලාත්මක බවින් උසස් නිමාවන්ගෙන යුක්තය.

i. අනුරාධපුරයේ කණ්ඨක චෛත්‍ය වාහල්කඩ ලක්දිව ඇති විශිෂ්ටම වාහල්කඩ ලෙස සැලකෙයි. වාහල්කඩ හා සම්බන්ධ කැටයම් හතරක් නම්කරන්න.

(ලකුණු 04).

ii. අනුරාධපුර යුගයේ සඳකඩපහනෙහි තීරු කැටයම් පිළිබඳ සෙනරත් පරණවිතාන ශූරීන්ගේ මතය එකිනෙක අර්ථගන්වන්න.

(ලකුණු 06)

iii. අල්පොන්නත පුවරු කැටයමක් වූ සඳකඩපහන යුගයෙන් යුගය ක්‍රමිකව විකාශය වූවකි. මෙහි ශිල්පීය කුෂලතා අගයමින් ක්‍රමික විකාශය පිළිබඳ විමසීමක් කරන්න

(ලකුණු 10)

## "ආ" කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)

04) ක්‍රි. ව. 1 සිට ක්‍රි. ව. 5 දක්වා බෞද්ධ කලා මධ්‍යස්ථානයක්ව පැවති ගාන්ධාරය භාරතයේ බෞද්ධ කලා ඉතිහාසයේ වැදගත් ස්ථානයක් හිමිකර ගනී.

i. ගාන්ධාර ශිල්පීන් වෙතින් බිහි වූ බුදු පිළිම තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii. විචාරකයන් අර්ථ දක්වන පරිදි ගාන්ධාර කලාවේ ස්වභාවය කෙටියෙන් පහදන්න. (ලකුණු 07)

iii. ගාන්ධාර කලා සම්ප්‍රදායට සමකාලීනව පැවති මථුරා කලා සම්ප්‍රදාය තුළ බිහි වූ බුදු පිළිම ගාන්ධාර පිළිමවලට වඩා ආධ්‍යාත්මික ගුනයෙන් පරිපූර්ණය. මථුරා හිටි පිළිම ඇසුරු කරගෙන මෙය විමසන්න (ලකුණු 10)

05) භාරතයේ හයිද්‍රාභාද් ප්‍රදේශයේ වඝෝරා ගංගාව අසබඩ පිහිටි මහා ගල් පර්වතයක කණින ලද ලෙන් 29න් සමන්විත අජන්තාව බෞද්ධ මධ්‍යස්ථානයක් සේම කලාගාරයකි.

i. මෙහි චෛත්‍ය ශාලා හා විහාර ශාලා යනුවෙන් දෙවර්ගයකි. මේවායේ දළ සටහන් ඇඳ දක්වන්න. (ලකුණු 04)

ii. අජන්තාවේ හමුවන බෞද්ධ සිද්ධි දෙකක් නම් කර ඒවායේ ප්‍රකාශිත පුවත සැකවින් හඳුන්වන්න. (ලකුණු 08)

iii. අජන්තාවේ 17වන ගුහාවේ හමුවන ''සිංහලාවදානය'' ඓතිහාසික සිද්ධියක් නිරූපණය කෙරෙන සිතුවමකි. මෙහි නිරූපිත අවස්ථා හඳුන්වමින් සම්පිණ්ඩනය පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 08)

06) පල්ලවයන් විසින් ක්‍රි. ව. 7 වැනි සියවසේ අරඹන ලද කලා සම්ප්‍රදායක් අඛණ්ඩව සියවස් 02ක පමණ කාලයක් දකුණු ඉන්දියාවේ මහබලිපුරම් නගරය ආශ්‍රිතව පැවතියේය.

i. පංච පාණ්ඩව රථ දේවාලය නම්කර ඒවායේ ශිල්ප ක්‍රම හඳුන්වමින් ගෘහ නිර්මාණ ලක්ෂණ විස්තර කරන්න (ලකුණු 05)

ii. මහීෂ මාධිනී ගුහාවේ ඇති ''දුර්ගාදේවිය විසින් අසුරයින් පැන්වීම'' නම් කැටයම පිළිබඳ කෙටි ඇගයීමක යෙදෙන්න. (ලකුණු 05)

iii. වෙරළාසන්න ගල් පරයක ඉදි වූ ''ආකාශ ගංගාවරෝහණය'' දැක්වෙන කැටයම හි වස්තු විෂය ශිල්පක්‍රමය සම්පිණ්ඩනය පිළිබඳ ඇගයීමක යෙදෙන්න. (ලකුණු 10)

e-තක්සලාව The National e-learning Portal for the General Education